පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 02

විෂය:- පුරවැසි අධ්‍යාපනය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

(1)

i ඒකීය ආණ්ඩුවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

ii සී.එන්.ස්ට්‍රෝන්ග්ට අනුව ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ දෙක දක්වන්න.

iii ආණ්ඩුවක ප්‍රධාන අංග ලක්ෂණ තුන නම් කොට ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න.

(2)

i ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද?

ii 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ව්‍යවස්ථාදායකයේ සංයුතිය දක්වන්න.

iii 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණ දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

(3) පහත වගුව සම්පූර්ණ කරන්න

ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ නම	ව්‍යවස්ථාදායකයේ නම	සංයුතිය
1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය		
1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය		
1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව		
1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව		

(4)

i ශ්‍රී ලංකාවේ බලය බෙදීම පිළිබඳ අදහස ක්‍රියාවට නැංවීමට ගත් උත්සහයන් දෙකක් දක්වන්න.

ii 1865 මහ නගර සභා ආඥා පනත යටතේ පිහිට වූ ප්‍රථම මහ නගර සභා තුන නම්කරන්න.

iii ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන තුන දක්වා ඔබ ජීවත්වන ප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනය නම්කරන්න.

(5)

i රටක ව්‍යවස්ථාදායකයේ කාර්යයන් දෙකක් දක්වන්න.

ii රටක විධායකයේ කාර්යයන් දෙකක් දක්වන්න.

iii ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායකයේ ප්‍රධානියා කවුරුන්ද?